| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 8 ශ්‍රේණිය | **භූගෝල විද්‍යාව** |

නම/ විභාග අංකය: .........................................  කාලය පැය 2 යි

**I කොටස**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට අංක 10 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) සෞරග්‍රහ මණ්ඩලයේ වැඩිම ගුරුත්වාකර්ෂණ බලයක් ඇති ග්‍රහලෝකය කුමක්ද?

1. බ්‍රහස්පති
2. සෙනසුරු
3. යුරේනස්
4. අඟහරු

(2) වාමන ග්‍රහයෙක් වන්නේ මින් කුමක්ද?

1. අඟහරු
2. බුධ
3. බ්‍රහස්පති
4. ප්ලූටෝ

(3) දකුණු ආසියානු කලාපීය රටකි.

1. කාම්බෝජය
2. වියට්නාමය
3. භූතානය
4. ජපානය

(4) සින්දු ගඟ පිහිටා ඇත්තේ කුමන රටේද?

1. පාකිස්ථානය
2. ඉන්දියාව
3. බංගලාදේශය
4. නේපාලය

(5) 1:50,000 හු ලක්ෂණ සිතියමක සිතියම් පත්‍ර අංක 54න් දැක්වෙන්නේ කුමන සිතියම් ගත ප්‍රදේශයද?

1. කෑගල්ල
2. ගම්පොළ
3. මාතලේ
4. මහනුවර

(6) සූර්යයාගේ මතුපිට සූර්ය කුණාටු ඇති වන විට සිදුවන ක්‍රියාවලිය මින් කුමක්ද?

1. තාපය ලබාදීම යි
2. ගිනිදළු විහිදීම යි
3. සුළඟක් ඇතිවීම යි
4. අවට වායුව ගිනි ගැනීම යි

(7) දේශාංශ පදනම් කරගනිමින් පෘථිවිය සම්මත වේලා කලාප කීයකට බෙදා තිබේද?

1. වේලා කලාප 04
2. වේලා කලාප 15
3. වේලා කලාප 24
4. වේලා කලාප 360

(8) දකුණු ආසියානු කලාපයේ ජනගහනය අධිකතම රට මින් කුමක්ද?

1. ඉන්දියාව
2. පාකිස්තානය
3. බංගලාදේශය
4. චීනය

(9) වේලා කලාප කිහිපයක් දක්නට ලැබෙන රටකි.

1. ශ්‍රී ලංකාව
2. මැඩගස්කරය
3. ඇමරිකා එක්සත් ජනපදය
4. එංගලන්තය

(10) - මතුපිට උෂ්ණත්වය $167C^0$ කි.

- ගිනිකඳු පිපිරීමෙන් නිර්මාණය වූ ආවාට මතුපිට දක්නට ලැබේ.

ඉහත ලක්ෂණ දැකිය හැකි ග්‍රහලෝකය වන්නේ,

1. සිකුරු ග්‍රහලෝකයයි
2. අඟහරු ග්‍රහලෝකයයි
3. බුධ ග්‍රහලෝකයයි
4. යුරේනස් ග්‍රහලෝකයයි

- **ප්‍රශ්න අංක 10 - 15 දක්වා ඇති ප්‍රකාශ හොඳින් කියවා නිවැරදි නම් 'නි' යන්න ද වැරදි නම් 'වැ' යන්න ද යටින් ඉරක් අඳින්න.**

(11) සූර්යාගේ විෂ්කම්භය කි.මී. මිලියන 1.4 කි. (නි / වැ)

(12) ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය මීටර් 20 කි. (නි / වැ)

(13) කැල්ටෙක් තාරකා විද්‍යා ආයතනය සෝවියට් දේශයට අයත්ය. (නි / වැ)

(14) වේලාව ගණනය කිරීමට අක්ෂාංශ යොදා ගනියි. (නි / වැ)

(15) මුම්බායි නගරය බොලිවුඩ් නමින් ලොව ප්‍රචලිතය. (නි / වැ)

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා හිස්තැන්වලට අදාල පිළිතුරු සපයන්න.**

(16) සෞරග්‍රහ මණ්ඩලයේ තෙවන විශාලතම ග්‍රහලෝකය …………………….. වේ.

(17) පහන් තරුව ලෙස …………………….. ග්‍රහයා හඳුන්වයි.

(18) ෆොබොස් හා ඩයිමෝස් ලෙස නම් කර ඇති උපග්‍රහයන් දෙදෙනෙක් …………………….. ග්‍රහයාට ඇත.


(19) …………………….. ග්‍රහයා වටා දර්ශනීය වළලු පද්ධතියක් පිහිටා ඇත.

(20) මුළු පෘථිවියෙන් …………………….. ක් ජලයෙන් වැසී පවතී.


## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **ඉතිරි ප්‍රශ්නවලින් හතරක් තෝරා ගන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

1. සපයා ඇති සිතියමෙහි A, B, C, D, E, F, H යන අක්ෂර වලින් දක්වා ඇති රටවල් සහ ස්ථාන නම් කරන්න.




- සපයා ඇති 1:50,000 භූ ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර පහත සඳහන් ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.




i. සිතියමෙහි A, B කඩ ඉරි වලින් දක්වා ඇති භූලක්ෂණය ……………………..

ii. ත්‍රිකෝණමිතික ස්ථානයෙහි උස ……………………..

iii. E - F රේඛාවෙන් දක්වා ඇති භූ ලක්ෂණය ……………………..

iv. ප්‍රධාන ගංගාව ගලා බසින දිශාව ……………………..

2.

i. බාහිර ග්‍රහලෝක 3ක් නම් කරන්න. (ල. 3)

ii. වාමන ග්‍රහයින් යනු මොනවාද? (ල. 4)

iii. ග්‍රහ මණ්ඩලය හා බැඳී පවතින විශ්වාස 5ක් ලියන්න. (ල. 5)

3.

i. වායුගෝලයේ ඇති ප්‍රධාන වායු වර්ග 03ක් නම් කරන්න. (ල. 3)

ii. වායුගෝලයෙන් ලැබෙන ප්‍රයෝජන 04ක් ලියන්න. (ල. 4)

iii. වායුගෝලය දූෂණය වීමට හේතුවන මානුෂ ක්‍රියාකාරකම් 03ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

4.

i. සාර්ක් සංවිධානයට අයත් රටවල් දෙකක් නම් කරන්න. (ල. 3)

ii. හිමාලය කඳුකරයේ වාසය කරන ජනවර්ග දෙකක් ලියන්න. (ල. 4)

iii. (අ) හිමාලය කඳුකරයේ ජීවත්වන ජනතාවගේ රැකියා දෙකක් ලියන්න.

(ආ) හිමාලය කඳුකරයේ ජනතාවගේ නිවාස හා කෘෂිකර්මය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

5.

i. පෘථිවි භ්‍රමණය නිසා ඇතිවන සංසිද්ධි දෙකක් ලියන්න. (ල. 3)

ii. පෘථිවි භ්‍රමණය සහ පරිභ්‍රමණය යනු කුමක්දැයි හඳුන්වන්න. (ල. 4)

iii. (අ) පෘථිවියේ ප්‍රධාන ඍතු හතරකි. ඉන් දෙකක් නම් කරන්න.

(ආ) ඉහත ඔබ සඳහන් කළ ඍතු අතරින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

6.

i. ''සෞරග්‍රහ මණ්ඩලයේ සූර්යාගේ සිට තෙවන ග්‍රහලෝකය ලෙස පිහිටා ඇත්තේ අප ජීවත් වන පෘථිවියයි.''

A. සූර්යයාගේ සිට පෘථිවියට ඇති දුර

B. පෘථිවියේ උත්තරධ්‍රැවය හා දක්ෂිණධ්‍රැවය යා කරමින් නිර්මාණය කර ඇති රේඛා

C. එම රේඛා අතර $180^0$ රේඛාව හඳුන්වන නම ලියා දක්වන්න. (ල. 3)

ii. ජීවීන්ගේ වාසභූමියක් ලෙස පෘථිවිය වැදගත් වීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ල. 4)

iii. පෘථිවි ආදර්ශ ගෝලයේ රූප සටහනක පහත සඳහන් අක්ෂාංශ රේඛා ඇඳ දක්වන්න. (ල. 5)

A. - කර්කටක නිවර්තනය

B. - මකර නිවර්තනය

C. - සමකය


D. - ආක්ටික් වෘත්තය

E. - ඇන්ටාක්ටික් වෘත්තය

7. පහත දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

1. රතු ග්‍රහයා නමින් හඳුන්වන ග්‍රහලෝකය
3. වාමන ග්‍රහයෙකි
6. ඍතු හතරින් එකකි
7. පෘථිවියේ උපග්‍රහයා නමින් හඳුන්වයි
8. ග්‍රාහක වළල්ලෙන් පිටත පිහිටි ග්‍රහලෝක මෙනමින් හඳුන්වයි
10. ධීවර කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනයකි
11. ප්‍රධාන වී වගා කන්නයකි




<u>පහළට</u>

2. ලොව විශාලතම රට වේ
4. වාෂ්පීකරණය හා උෂ්ණත්වය අධික ප්‍රදේශ
5. දවසේ එක් කාලයකි
9. එවරස්ට් කන්ද පිහිටා ඇති කඳුවැටිය